*සැ. යු.*- 2012.08.24 දින පළ වූ අංක 1,773 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV (අ) කොටස් පළ නොවීය.
මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2009 වර්ෂයේ ජනවාරි - මාර්තු කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,774 - 2012 අගෝස්තු 30 වැනි බ්‍රහස්පතින්දා - 2012.08.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 748 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා සියලු ම දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 සැප්තැම්බර් මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 සැප්තැම්බර් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# විවිධ දැන්වීම්

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

තම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය

නඩු අංකය :
එච්. සී. (සිවිල්)
26/2012/සීඕ

එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 03, ආර්. ඒ. ද මැල් මාවතේ, 1 වැනි මහලේ, අංක 351 හි පිහිටි මැරිටයිම් ලොජිස්ටික්ස් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් [N (PVS) 28975 ] පිළිබඳ කාරණය සම්බන්ධවයි.

සහ

ස්වභාවය :
ගණන් බේරා
වසා දැමීම

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ සහ ඒ ප්‍රකාරව ගරු අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සඳහා වූ අයැදුම්පත පිළිබඳ කාරණය සම්බන්ධවයි.

ක්ෂානක නිරංග වික්‍රමසිංහ,
අංක 129, නාගහවත්ත පාර,
දළුගම,
කැළණිය.

.............................................................. පෙත්සම්කරු.

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොළඹ දී පැවැත්වෙනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා කැළණිය, දළුගම, නාගහවත්ත පාර, අංක 129 හි පදිංචි ක්ෂානක නිරංග වික්‍රමසිංහ විසින් 2012 ජූනි මස 14 දින එකී අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, එකී පෙත්සම 2012 ඔක්තෝබර් මස 04 වැනි දින අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සඳහා සහාය දීමට හෝ ඊට විරුද්ධ වීමට කැමැත්තක් දක්වන එකී සමාගමේ කවර හෝ ණයහිමියෙකුට හෝ දායකයෙකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම කරන අවස්ථාවේ පුද්ගලිකව හෝ සිය නීතිඥ මගින් පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත, පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

එෆ්. ජේ. සහ ජී. ද සේරම්,
නීතිඥවරු,
අංක 216, ද සේරම් පෙදෙස,
කොළඹ 10.

සටහන.- එකී පෙත්සම සම්බන්ධ විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් එෆ්. ජේ. සහ ජී. ද සේරම් නීතිඥ මහතුන්ට ලිඛිතව දන්වා බාරදිය යුතු ය. නැතහොත්, තැපෑලෙන් එවිය යුතු ය. දැනුම්දීම කරන පුද්ගලයාගේ නම හා ලිපිනය ද, සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය දැන්වීමේ ප්‍රකාශ කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙක් සිටී නම්) නීතිඥවරයා/වරිය විසින් අත්සන් කළ යුතු අතර, 2012 ඔක්තෝබර් මස 03 වැනි දින පස්වරු 6.00 ට පෙර බාරදිය යුතු ය. නැතහොත්, තැපැල් මගින් එවන්නේ නම්, ප්‍රමාණවත් කාලය තුළ (ඉහත නම සඳහන් නීතිඥවරුන්ට) ඔවුන්ට ලැබෙන ලෙසට තැපැල් මගින් එවිය යුතු ය.

08-848

---

## ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

තම සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය

එහි ලියාපදිංචි කාර්යාලය දිවුලපිටිය, වල්පිට, කුඩගම්මන පිහිටි කැපිටල් කොන්සොලිඩේටඩ් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (පී වී 11438) සම්බන්ධ කාරණය පිළිබඳවයි

නඩු අංකය :
එච්. සී. (සිවිල්)
36/2012/සීඕ.

සහ

ස්වභාවය :
ඈවර කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ XII කොටස යටතේ සහ ඒ ප්‍රකාරව අධිකරණය මගින් ගණන් බේරා වසාදැමීම සඳහා වූ ඉල්ලීම පිළිබඳවයි.

MAC සප්ලයි චේන් සොලූෂන්ස් (ප්‍රයිවට්)
ලිමිටඩ්,
අංක 141/9, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

.................................................... පෙත්සම්කරු.

සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කොළඹ දී පැවැත්වෙනු ලබන බස්නාහිර පළාතේ, මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා කොළඹ 02, වොක්ෂෝල් වීදිය, අංක 141/9 හි MAC සප්ලයි චේන් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2012 අගෝස්තු මස 07 වැනි දින එකී අධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ බවත්, එකී පෙත්සම 2012 ඔක්තෝබර් මස 15 වැනි දින අධිකරණය ඉදිරියේ විමසීම සඳහා නියම කරනු ලැබූ බවත්, එකී පෙත්සම සම්බන්ධව නියෝගයක් කිරීම සඳහා සහාය දීමට හෝ ඊට විරුද්ධ වීමට කැමැත්තක් දක්වන එකී සමාගමේ කවර හෝ ණයහිමියෙකුට හෝ දායකයෙකුට එම අරමුණ වෙනුවෙන් එකී විමසීම

කරන අවස්ථාවේ පුද්ගලිකව හෝ සිය නීතිඥ මගින් පෙනී සිටිය හැකි බවත්, පෙත්සමේ පිටපතක් අවශ්‍ය සමාගමේ කවර හෝ ණය හිමියෙකුට හෝ දායකයෙකුට නියමිත ගාස්තු ගෙවීම මත, පහත අත්සන් කරනු ලබන අය විසින් එය සපයනු ලබන බවත්, මෙයින් නිවේදනය කරනු ලැබේ :-

එෆ්. ජේ. සහ ජී. ද සේරම්,
නීතිඥවරු,
අංක 216, ද සේරම් පෙදෙස,
කොළඹ 10.

සටහන.- එකී පෙත්සම සම්බන්ධ විමසීමේ දී පෙනී සිටීමට අදහස් කරන කවර හෝ පුද්ගලයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් එෆ්. ජේ. සහ ජී. ද සේරම් නීතිඥ මහතුන්ට ලිඛිතව දන්වා බාරදිය යුතු ය. නැතහොත් තැපෑලෙන් එවිය යුතු ය. දැනුම්දීම කරන පුද්ගලයාගේ නම හා ලිපිනය ද, සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය දැන්වීමේ ප්‍රකාශ කළ යුතු අතර, පුද්ගලයා හෝ සමාගම විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයෙක් සිටී නම්) නීතිඥවරයා/වරිය විසින් අත්සන් කළ යුතු අතර 2012 ඔක්තෝබර් මස 13 වැනි දින පස්වරු 1.00 ට පෙර බාරදිය යුතු ය. නැතහොත් තැපැල් මගින් එවන්නේ නම්, ප්‍රමාණවත් කාලය තුළ (ඉහත නම සඳහන් නීතිඥවරුන්ට) ඔවුන්ට ලැබෙන ලෙසට තැපැල් මගින් එවිය යුතු ය.

පෙත්සම්කරුගේ නීතිඥවරු.

08-896

---

## ජම්ඉය්යතුස් සන්වා අල්-හයිරිය්යා (ජස්කා) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

එම්. බී. ෆාරුක් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "ජම්ඉය්යතුස් සන්වා අල්-හයිරිය්යා (ජස්කා) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි." යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංගමය සංස්ථාගත කිරීමයි :-

1. දිළිඳු තැනැත්තන්ගේ ජීවන තත්වය නගා සිටුවීම ;

2. වැඩිහිටි තැනැත්තන්, ආබාධිතයන්, අනාථ දරුවන් සහ වැන්දඹුවන්ගේ අවශ්‍යතාවන් සොයා බලා ඒවා සපුරා දීම සහ ඔවුන්ට උපකාර කිරීම ; සහ

3. ළමුන්ගේ හා කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ඔවුන්ට උපකාර කිරීම

යනාදිය වේ.

එම්. බී. ෆාරුක්,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

08-919

---

## ජාමියා රහ්මානියා අරාබි විදුහල, අකුරණ සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

අබ්දුල් හලීම් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ ජාමියා රහ්මානියා අරාබි විදුහල අකුරණ සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී විදුහල සංස්ථාගත කිරීමයි :-

1. ජාමියා රහ්මානියා අරාබි විදුහලේ පරිපාලන පවත්වාගෙන යාම ;

2. අරාබි, සිංහල, ඉංග්‍රීසි, දෙමළ සහ උර්දු භාෂාවන් ඉගැන්වීම.

යනාදිය වේ.

අබ්දුල් හලීම්,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
මහනුවර දිස්ත්‍රික්කය.

08-920

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.